ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT



මගේ අංකය : PS/SD/GS/උපදෙස් පත්‍රිකා 2018-(3)
තිරසර සංවර්ධන අංශය
ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය

2018.08.23

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත,

ප්‍රිය දිසාපතිතුමණි,

<u>ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීම හා ක්‍රියාත්මක කිරීම</u>

01. ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ග්‍රාමනිලධාරී වසම් මට්ටමින් තෝරාගෙන ඇති ප්‍රජාපාලිත හා නිෂ්පාදන සේවා අභිමුඛ ගම්මානවල පිහිටුවා ඇති සීමා සහිත ග්‍රාමශක්ති ජනතා සමිති මේ වන විට ලියාපදිංචි කර අවසන් වෙමින් පවතී.

02. ඒ අනුව සමිති සාමාජිකත්වය සහ සමාජිකයින්ගේ පවුල්වල සාමාජික සංඛ්‍යාව පදනම් කරගනිමින් එක් අයකුට රු.8000 බැගින් වූ එක් වරක් පමණක් ලබාදෙන සමිති අරමුදලේ ප්‍රතිපාදනයේ පළමු වාරිකය (රුපියලි මිලියන 1ක්) දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත මේ වන විටත් ලබා දී ඇත.

03. සමිති අරමුදලට අදාළ ඉතිරි ප්‍රතිපාදන සමිති සාමාජික සහ සමාජික පවුල්වල මුළු සාමාජික සංඛ්‍යාව පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ තහවුරුව ලැබීමෙන් අනතුරුව ලබාදෙනු ඇත.

04. මෙම අරමුදලින් 30% ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෙදවිය හැකිය. ඒ සඳහා අදාළ ව්‍යාපෘති ග්‍රාම සංවර්ධන සැලැස්මේ ප්‍රමුඛතා මත තෝරාගත යුතුය. එහෙත් පළමු යටිතල පහසුකම් ව්‍යාපෘතිය තෝරා ගැනීමේ දී රුපියල් මිලියන 1ක් නොයික්ම වන ව්‍යාපෘතියක් තෝරා ගැනීමට කටයුතු කළ යුතුය.

05. ග්‍රාම සංවර්ධන සැලැස්මට අනුව ප්‍රමුඛතා මත තෝරාගෙන ඇති ව්‍යාපෘතිය/වැඩසටහන වෙනත් වැඩසටහනක් (ගම්පෙරළිය, විමධ්‍යගත අරමුදල්, පළාත් සභා අරමුදල් ආදී) යටතේ දැනටමත් ප්‍රතිපාදන ලබා දී තිබේ නම් ඊළඟ ප්‍රමුඛතා ව්‍යාපෘතිය තෝරාගත යුතුය.

06. එසේ තෝරා ගන්නා ව්‍යාපෘතිය ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සෘජු දායකත්වයක් ලබාදෙන, ග්‍රාමනිලධාරී වසමේ වැඩි ජනතාවට ප්‍රතිලාභ හිමිවන ව්‍යාපෘතියක් වීම වැදගත් වේ.

07. ව්‍යාපෘතිය සඳහා මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුවෙන් 20% කට නො අඩු ප්‍රජා දායකත්වයක් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ව්‍යපෘතිය සඳහා ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා අදාල සමිතිවලට ලබාදෙනු ඇත.

08. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරියා විසින් සිදුකළ යුතුය.

09. ව්‍යාපෘතිය මෙහෙයවීම සමිතිය මඟින් විය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් සහ සමිතියේ ප්‍රධාන නිලධාරීන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹිය යුතුය.

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
Galle Face, Colombo 01

දුරකථන / தொலைபேசி / Telephones: 011 2354354, 011 4354354

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2340340

ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail: ps@presidentsoffice.lk

10. ව්‍යාපෘතියේ සෘජු අධීක්ෂණය වසම්භාර සංවර්ධන නිලධාරියා විසින් සිදු කළ යුතුය. සති දෙකකට වරක් ව්‍යාපෘතියේ ප්‍රගතිය ප්‍රාදේශීය ලේකම්ට වාර්තා කළ යුතුය.

11. ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ව්‍යාපෘති නිරීක්ෂණය කළ යුතුය.

12. මාසයකට වරක් කොට්ඨාසයේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනයක් ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සිදු කළ යුතුය.

13. මාසික ප්‍රගතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ග්‍රාමශක්ති ප්‍රධාන කාර්යාලයට වාර්තා කළ යුතුය. (ඊළඟ මස 10 වන දිනට පෙර)

14. ග්‍රාමශක්ති ජනතා වැඩසටහන යටතේ ගමෙහි ආරම්භ කරන පළමු ව්‍යාපෘතිය මාස 03ක් ඇතුළත සම්පූර්ණයෙන්ම නිම කළ යුතුය.

15. ව්‍යාපෘති ක්‍රියාත්මක වන අවස්ථාවන්හි දී තාක්ෂණ නිලධාරීන් විසින් සුපරීක්ෂණය කළ යුතු අතර, ගෙවීම් සිදු කළ යුත්තේ තාක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශ හා යටිතල පහසුකම් සංවර්ධන කමිටුවේ නිර්දේශ මත පමණි.

16. ව්‍යාපෘතියක් සඳහා වෙන් කරනු ලබන ප්‍රතිපාදනයක් වෙනත් ව්‍යාපෘතියක් හෝ කාර්යයක් සඳහා යොදවා ගත හැක්කේ මහ සභාවේ අනුමැතිය සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ එකඟතාවය මත පමණි.

17. ග්‍රාමශක්ති වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සීමා සහිත ග්‍රාමශක්ති ජනතා සමිති ලියාපදිංචි කිරීමෙන් අනතුරුව සමිති ගිණුමට ලබාදිය යුතුය. එම ප්‍රතිපාදන පහත පරිදි වෙන් කෙරේ.

    I. ධාරිතා සංවර්ධනය 20% → හැකියා වර්ධනය 10%
    → නිපුණතා වර්ධනය 10% (ස්වයං රැකියා සඳහා)
    II. යටිතල පහසුකම් සංවර්ධනය 30%
    III. ජීවනෝපාය සංවර්ධනය 50%

මෙම ලිපියේ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කරන්නේ නම් මැනවි. ග්‍රාමශක්ති ජනතා වැඩසටහන ඔබ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඔබ දක්වන සහයෝගය සහ ධනාත්මක ප්‍රතිචාරය ඉතා අගය කොට සලකමි.

මෙයට සේවයට ලැදි,

චන්ද්‍රරත්න පල්ලේගම
ජනාධිපති අතිරේක ලේකම්
තිරසර සංවර්ධන අංශය